(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 1(11).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2019 මාර්තු 15 සිකුරාදා**

---

## 2019 අප්‍රේල් 01 වැනි සඳුදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

409/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සහ 2016 තුළදී,

(i) ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජනවලින් උපයාගෙන රටෙන් බැහැර කරගෙන ගොස් ඇති ලාභ ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ මුදල් බැහැර කරගෙන යෑම හේතුවෙන් රුපියලේ අගය කොපමණ බලපෑමකට ලක් වූයේද;

(iii) එක් එක් ආයෝජනය මඟින් ශ්‍රී ලංකාවට රැකියා අවස්ථා මඟින් ලැබුණු ප්‍රතිලාභය සහ වෙනත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

470/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2000 සිට 2018 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ දියර කිරි (එළකිරි) නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කාල සීමාවට අදාළ කිරි නිෂ්පාදනය සඳහා දායක වූ ප්‍රධාන දිස්ත්‍රික්ක කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ මේ වනවිට සිටින කිරි ගොවීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2000 සිට 2018 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද,

(i) කිරිපිටි ප්‍රමාණය සහ එහි වටිනාකම ඇ.එ.ජ. ඩොලර්වලින්;

(ii) කිරිපිටි සඳහා රජය අය කරනු ලැබූ බදු සහ ඒවායේ සංශෝධන සහ එමඟින් රජයට ලැබුණු ආදායම;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

478/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් අංක 320, ඩාලි පාර කොළඹ 10 යන ලිපිනයේ පිහිටි වර්ග අඩි 14500ක ගොඩනැගිල්ල බදු පදනම මත ලබා දී ඇති ආයතනය කවරේද;

(ii) එම ගොඩනැගිල්ල බදු දී තිබූ කාලය සහ බදු මුදල කොපමණද;

(iii) වසර 05කට වරක් තක්සේරුව යාවත්කාලීන කරමින් නව තක්සේරු මිලට එම ගොඩනැගිල්ලේ බදු දීම සිදු කරගෙන යනු ලබන්නේද;

(iv) ගිවිසුමට අනුව බදුකරුගෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අය විය යුතු මුදල් අය කරගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

481/'19

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2012 සිට 2015 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අනුග්‍රහය දැක්වූ සියලු ආයතන කවරේද;

(ii) ඒ වෙනුවෙන් ලැබුණු මුදල කොපමණද;

(iii) වර්ෂ 2016 සිට 2018 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අනුග්‍රහය දැක්වූ සියලු ආයතන කවරේද;

(iv) ඒ වෙනුවෙන් ලැබුණු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2013 සිට 2016 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් හා ඩයලොග් සමාගමෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ලබාදුන් මූල්‍ය අනුග්‍රාහක දායකත්වය කොපමණද;

(ii) වර්ෂ 2016 සිට 2018 දක්වා කාලය තුළ ඩයලොග් සමාගම දැක්වූ අනුග්‍රහයේ මූල්‍ය වටිනාකම සහ එම කාලය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතු අයිතීන් විකුණනු ලැබුවේ කවුරුන්ටද;

(iii) ඒ සඳහා අනුගමනය කළ ක්‍රියාපටිපාටිය කවරේද;

(iv) එමඟින් ලැබූ ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

518/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.01.01 දින සිට 2015.01.01 දින දක්වා ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් රාජ්‍ය බැංකුවලින් ලබාගෙන ඇති මුළු උකස් ණය ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතරින් ස්වර්ණාභරණ උකස්කර ලබාගෙන ඇති ණය ප්‍රමාණය කොපමණද;

(iii) ස්වර්ණාභරණ උකස්කර රුපියල් ලක්ෂ දෙකට වඩා අඩුවෙන් ණය ලබාගෙන ඇති ස්ත්‍රීන් හා පුරුෂයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (i) හි සඳහන් ණය ප්‍රමාණය එම කාලසීමාව තුළ නිකුත් කර ඇති සමස්ත ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

622/'18

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවතින ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) අනුරාධපුර ඩිපෝවට අයත් බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අතරින් ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින බස්රථ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2018.09.21 දින අනුරාධපුර ඩිපෝවේ බස් රථ ධාවනය කර තිබේද;

(ii) එදින ධාවනය කළ බස් රථවල ධාවන සටහන් ඉදිරිපත් කරන්නේද;

(iii) එදින ලැබූ ආදායම කොපමණද;

(iv) එදින වෙනත් කාර්යයක් සඳහා බස්රථ යොදවා තිබේද;

(v) එසේ නම්, එම කාර්යය කුමක්ද; යෙදවූ බස් රථ සංඛ්‍යාව කොපමණද;

(vi) එම කාර්යය සඳහා අදාළ අමාත්‍යාංශය විසින් ගෙවීම් කර තිබේ නම්, එම මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

627/'18

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට සයිප්‍රස්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අනුව ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් කොන්සල් කාර්යාලයක් හෝ තානාපති කාර්යාලයක් පිහිටුවීමට රජය තීරණය කර තිබේද;

(iii) එසේ නම්, එම කාර්යාලය ස්ථාපිත කිරීමෙන් අනතුරුව, ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා රජයට දැරීමට සිදුවන මුළු මුදල කොපමණද;

(iv) එමඟින් ශ්‍රී ලංකා රජයට විශේෂ ප්‍රතිලාභ ලැබෙන්නේද;

(v) එසේ නම්, එම ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

681/'18

ගරු කනක හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම සතු ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ගුවන් යානය භාවිතා කර ඇති කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කල්බදු ගිවිසුම් අවසන් වීමෙන් පසු අදාළ සමාගම් වෙත නැවත ලබා දුන් ගුවන් යානා භාවිතා කර ඇති කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙලෙස නැවත ලබා දුන් ගුවන් යානාවලට වඩා පැරණි ගුවන් යානා සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම සතුව කල්බදු ක්‍රමය යටතේ තවමත් භාවිතා කරනු ලබන්නේද;

(iii) එසේ නම්, මෙතරම් පැරණි ගුවන් යානා මෙතෙක් රඳවා ගැනීමට ඇති අවශ්‍යතාවය කවරේද;

(iv) ඒ සඳහා වන නිර්ණායක කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 අප්‍රේල් 02 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5/'18

ගරු හේෂා විතානගේ මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2010 - 2015 කාලය තුළ ආරම්භ කරනු ලැබූ උදාගම් නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ව්‍යාපෘතිවල නිවාස ප්‍රතිලාභීන් තෝරා ගැනීමට අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදය කවරේද;

(iii) අදාළ ව්‍යාපෘති හරහා ප්‍රතිලාභීන් ලෙස සහන ලැබූ සංඛ්‍යාව කොපමණද;

(iv) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා රටේ නිවාස නොමැති ජනතාව වෙනුවෙන් ප්‍රමාණවත් සහයෝගයක් ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පැහැර හැර ඇති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

117/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දඹදිව වන්දනා ගමන් සංවිධානය කිරීමට අවසර ලත් ආයතන හා පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් හා පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා දඹදිව වන්දනා ගමන්වලදී මියගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම මියගිය පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) එම පුද්ගලයන් දඹදිව රැගෙන ගිය ආයතන කවරේද;

(vi) එසේ මියගිය පුද්ගලයන්ගේ පවුල්වල සුබසාධනය වෙනුවෙන් අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

410/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බහාලුම්වල අසුරන ලද විදුලි උත්පාදක සවි කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ තීරණය අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් නිෂ්ප්‍රභ කොට පළමු අවස්ථාවේ ප්‍රතික්ෂේප කරනු ලැබූ ලංසු තබන්නන් දෙදෙනෙකු නැවත ඇගයීමට ලක් කරන ලෙස තාක්ෂණික ඇගයීම් කමිටුවෙන් ඉල්ලා සිටියේද;

(ii) වඩාත්ම සුදුසු සහ ප්‍රතිචාරාත්මක අඩුම ලංසු තබන්නා වූ සෙනොක් ට්‍රේඩ් කම්බයින් පුද්ගලික සමාගම, 2017.07.12 දිනැති සිය වාර්තාවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව දෙවන වරටත් නිර්දේශ කරනු ලැබුවේද;

(iii) අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව, තාක්ෂණික ඇගයීම් කමිටුවේ තීරණය නිෂ්ප්‍රභ කොට අමාත්‍ය මණ්ඩල අනුමතිය හරහා 2017.07.31 දින ඉන්දියාවේ ස්ටර්ලිං සහ විල්සන් සමාගමට ටෙන්ඩරය ප්‍රදානය කළේද;

(iv) සෙනොක් ට්‍රේඩ් කම්බයින් පුද්ගලික සමාගම ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කළේද;

(v) සෙනොක් සමාගම තම ටෙන්ඩරයේ, අදාළ සවිකිරීම සඳහා ශුන්‍ය පිරිවැයක් අන්තර්ගත කර තිබියදී, ස්ටර්ලිං සහ විල්සන් සමාගමේ සහ කොරියානු සමාගමක ලංසු නැවත සලකා බලන ලෙස අමාත්‍යාංශය සහ ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය තාක්ෂණික ඇගයීම් කමිටුවෙන් ඉල්ලා සිටි හේතුව කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

479/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2018 දක්වා කාලය තුළ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන වතුයායේ තේ දලු නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නිෂ්පාදන අලෙවි කිරීමෙන් වාර්ෂිකව ලැබූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2018.06.30 දින වනවිට තේ දළු අලෙවියෙන් ලැබිය යුතු සම්පූර්ණ මුදල ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අය වී තිබේද;

(iv) නොඑසේ නම්, හිඟ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

675/'19

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා,— සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් වර්ෂයකට විදේශීය සංචාරකයන් මිලියන 2.5 ක් ගෙන්වා ගැනීමේ ජාතික ඉලක්කයක් තිබෙන බවත්;

(ii) ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන් වැඩි පිරිසක් මුහුදු වෙරළ කලාප නැරඹීමට එන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඒ සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ වෙරළ ආශ්‍රිතව හඳුනාගෙන ඇති සංචාරක වෙරළ කලාප කවරේද;

(iii) එම සංචාරක වෙරළ කලාප කඩිනමින් ස්ථාපිත කරන්නේ කෙසේද;

(iv) මේ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ ආකාරයට එක් වෙරළ කලාපයක් වැඩිදියුණු කිරීමට වැය වන මුදල කොපමණද;

(ii) කිසියම් වෙරළ තීරයක් සංචාරක වෙරළ කලාපයක් ලෙස නිර්දේශිත සහතිකයක් ලබා ගැනීම සඳහා ගත වන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්,ඒ මන්ද?

755/'19

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා,— ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 - 2018 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට අපනයනය කරන ලද ගම්මිරිස් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉන්දියාවට ගම්මිරිස් අපනයනය කිරීමේදී බලපත්‍ර නිකුත් කිරීමේ බලය පවරා ඇති නිලධාරියා කවුරුන්ද;

(iii) ශ්‍රී ලංකාවට ගම්මිරිස් ආනයනය කරන්නේද;

(iv) එසේ නම්, එම ආනයනය සඳහා බලපත්‍ර ලබා දුන් නිලධාරියාගේ සහ ආනයනකරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික ගම්මිරිස් නිෂ්පාදනය කොපමණද;

(ii) වර්ෂ 2010 සිට 2018 දක්වා කාලය තුළ ලෝක වෙළඳපොළේ උපරිම ගම්මිරිස් මිල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

757/'19

ගරු රොෂාන් රණසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019.01.01 සිට 2019.01.31 දක්වා කාලය තුළ සීමාසහිත GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම හරහා මනම්පිටිය වැලි තොටුපොළින් නිකුත්කර ඇති වැලි කියුබ් ප්‍රමාණය කොපමණද;

(ii) GSMB සමාගම හරහා දෛනික වැලි නිකුත් කිරීමේ ප්‍රමුඛතාවය (ටෝකන් ලබාදීම) ලබාදීම සිදුවන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) GSMB සමාගමෙන් මනම්පිටිය වැලි තොටුපොළ වෙනුවෙන් දෛනිකව සහ මාසිකව රජයට ලැබෙන ආදායම කොපමණද;

(ii) වර්ෂ 2013 සිට 2018 දක්වා කාලය තුළ GSMB සමාගම හරහා රජයට ලැබුනු සමස්ත ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම මුදල් බැර වන ගිණුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

770/'19

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් සභා අතරින් නිල කාලය අවසන් වීම හේතුවෙන් මේ වනවිට විසුරුවා හැර ඇති පළාත් සභා සංඛ්‍යාව කොපමණද;

(ii) අදාළ පළාත් සභා විසුරුවා හැරීමෙන් පසුව මේ වනවිට ගතවී ඇති කාලය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(iii) විසුරුවා ඇති පළාත් සභාවලට අමතරව, ඉතිරිව ඇති පළාත් සභාවල නිල කාලය අවසන් වීමට ඇති කාලය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(iv) විසුරුවා හැර ඇති පළාත් සභාවල මැතිවරණ පවත්වා එම පළාත් සභා සක්‍රිය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 අප්‍රේල් 03 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

663/'18

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා— (1)

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ දැනට පවුල් 43,818ක් පමණ ජීවත්වන බවත්;

(ii) මෙම පවුල් අතරින් පවුල් 4,039කට නැවත පදිංචි කළ පසු මෙතෙක් විදුලි සම්බන්ධතා ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පවුල් සඳහා විදුලි සම්බන්ධතා ලබාදීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

247/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම කොට්ඨාසය තුළ කැණීම් නොකරන ලද එහෙත්, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඉහත කොට්ඨාසයේ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජමහා විහාර සංඛ්‍යාව කොපමණද; ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්ෂණ කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

452/'19

ගරු චන්දිම ගමගේ මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පදවිය නගරයේ සිට කහටගොල්ලෑව දක්වා (ප්‍රධාන මාර්ගයෙන් වම් පස පෙදෙස) වූ ප්‍රදේශය අභයභූමියක් ලෙස ගැසට් කර තිබුනද, මෙම ප්‍රදේශය තුළ පදවිය දිසා රෝහල, ගම්මාන, පන්සල් හා ප්‍රජා ශාලාව පිහිටා ඇති බවත්;

(ii) 1957 වර්ෂයේ සිට එම ප්‍රදේශය තුළ ජනතාව පදිංචි වී සිටින බවත්;

(iii) එහි පදිංචිකරුවන් කිහිප දෙනෙකු සතුව නීත්‍යානුකූල ඉඩම් බලපත්‍ර ඇති බවත්;

(iv) අනෙකුත් පදිංචිකරුවන් සඳහා ඉඩම් බලපත්‍ර ලබා ගැනීමට යෑමේදී වනජීවී කලාපයක් ලෙස නම් කර තිබීම ඊට බාධාවක් වී ඇති බවත්;

(v) මේ හේතුවෙන් පදවිය නගරය තුළ වර්ෂ ගණනාවක සිට පදිංචිව සිටින පුද්ගලයන් මහත් අපහසුතාවයකට ලක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉඩම් බලපත්‍ර නොමැතිව එම ඉඩම්වල පදිංචිව සිටින පුද්ගලයන්ට බලපත්‍ර ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

482/'19

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 වර්ෂයේ නිදහස් කුසලාන ක්‍රිකට් තරඟාවලිය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් බැහැරව එම තරඟාවලියේ විකාශන අයිතීන්/අනුග්‍රාහක ගෙවීම් තුන්වන පාර්ශ්වයක් හරහා සිදුකළ බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඔවුන්ට හිමිවූ කොමිස් මුදල කොපමණද;

(iii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට හිමිවීමට තිබූ සියලු මුදල් තුන්වන පාර්ශ්වයකට ලබා දීමට අනුමතිය ලබා දුන්නේ කවුරුන්ද;

(iv) එම වැරදි තීන්දුව ක්‍රියාත්මක කළ පුද්ගලයන්ට එරෙහිව ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

540/'19

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ එයාර් වයිස් මාර්ෂල් කේ.ටී.බී.පී. ජයම්පති මහතා 2008.01.08 දාතමින් සහනදායී පදනම යටතේ මෝටර් රථයක් ආනයනය කිරීමට බලපත්‍රයක් ලබාගෙන තම වාහනය රේගුවෙන් නිදහස් කරගෙන ඇති බවත්;

(ii) එම නිලධාරියාට යළිත් සහනදායී පදනම මත මෝටර් රථයක් ලබාගත හැක්කේ වසර 5කට පසුව වුවද, ඉහත කී බලපත්‍රය පිළිබඳ තොරතුරු සාවද්‍ය ලෙස සඳහන් කරමින් 2011.01.14 දින එවකට සිටි ගුවන් හමුදාපතිවරයාගේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශ සහිතව යළිත් සහනදායී පදනම යටතේ මෝටර් රථයක් ආනයනය කිරීමට අයදුම්පතක් ඉදිරිපත් කර, 2011.06.07 දින අදාළ බලපත්‍රය ලබාගෙන මෝටර් රථයක් ආනයනය කර ඇති බවත්;

(iii) ඒ අනුව ඔහු චක්‍රලේඛ නියමයන් උල්ලංඝනය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, මෙම නිලධාරියාට එරෙහිව ගත් නීතිමය පියවර කවරේද;

(ii) චක්‍රලේඛ නියමයන්ට එරෙහිව සහනදායී පදනම යටතේ මෝටර් රථයක් ගෙන්වීමට මෙම නිලධාරියාට නිර්දේශ නිකුත් කිරීම පිළිබඳව එවකට සිටි ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා ගුවන් හමුදාපතිවරයාට එරෙහිව ගනු ලැබූ නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

593/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා 288 හි සඳහන් කොටස් වෙළෙඳපොළ තැරැව්කරුවන් මුහුණ දී සිටි අර්බුදයන් කවරේද;

(ii) උක්ත අර්බුදයන් විසඳීම සඳහා, රජයේ මැදිහත් වීම සිදු වූ ආකාරය කවරේද;

(iii) වර්ෂ 2014 සිට 2016 දක්වා ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වූ තැරැව්කරුවන් සංඛ්‍යාව; ඔවුන්ගේ ප්‍රාදේශීය ව්‍යාප්තිය සහ එක් එක් වර්ෂයේ තැරැව්කාර ගණුදෙනු ප්‍රමාණය දැක්වෙන දත්ත වගුවක් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(iv) 2016 වර්ෂය තුළදී ඒකාබද්ධ වූ කොටස් වෙළෙඳපොළ තැරැව්කරුවන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

623/'18

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පොලිසිය සතු ධාවන තත්ත්වයේ පවතින වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවල මාදිලිය සහ අයත් වන පොලිස් ස්ථානය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(iii) දැනට ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2000 සිට 2018 වර්ෂයේ සැප්තැම්බර් දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකා පොලිසියට මිලදී ගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන මිලදී ගනු ලැබූ ආයතන කවරේද;

(iii) එම ආයතනවලින් මිලදී ගත් වාහන කවරේද;

(iv) ඒ සඳහා ණය පහසුකම් ලබාදී තිබේද;

(v) එසේ නම්, ණය පහසුකම් ලබා දී ඇති ආයතන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

682/'18

ගරු කනක හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම විසින් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් ගුවන් යානයක් එම සමාගම විසින් කල්බදු ක්‍රමය යටතේ වෙනත් ගුවන් සමාගමකට නැවත ලබා දී තිබේද;

(ii) එම ගුවන් යානය කල්බදු ක්‍රමය යටතේ ලබාගත් ලීසිං සමාගම සඳහා සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම විසින් ගෙවනු ලබන මාසික කල්බදු වාරිකය කොපමණද;

(iii) නැවත කල්බදු ක්‍රමය යටතේ ලබා දී ඇති ආයතනය විසින් සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගමට ගෙවනු ලබන මාසික කල්බදු වාරිකය කොපමණද;

(iv) ඉහත ගුවන් යානය ගුවන් මෙහෙයුම් බලපත්‍රයට සහ සිවිල් ගුවන් යානා ලියාපදිංචි ලේඛනයට ඇතුලත් වන්නේද;

(v) එම ගුවන් යානයට ලියාපදිංචි අංකයක් තිබේ නම්, එම අංකය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 අප්‍රේල් 04 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

8/'18

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඇඹිලිපිටිය චන්ද්‍රිකා වැවෙන් පානීය හා කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ලබාගන්නා පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඇඹිලිපිටිය සතිපොළේ අපද්‍රව්‍ය චන්ද්‍රිකා වැවට එක්වීම නිසා විශාල පරිසර දූෂණයක් සිදුවන බව දන්නේද;

(iii) එසේ නම්, එම තත්ත්වය අවම කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

120/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහියංගනය පොදු රැස්වීම් ශාලාව ස්ථාපිත කළ වර්ෂය කවරේද;

(ii) අද වනවිට එම පොදු රැස්වීම් ශාලාවේ අඩුපාඩු රාශියක් තිබෙන බව දන්නේද;

(iii) එසේ නම්, එම අඩුපාඩු කවරේද;

(iv) එම අඩුපාඩු අවම කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

221/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා යුද හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවය කරනු ලබන වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංක එක් එක් හමුදාව අනුව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

326/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විශාල ප්‍රදේශයක් ආවරණය කරනු ලබන මැදවච්චිය පොලිස් ස්ථානය ඉතාමත් පැරණි ගොඩනැගිල්ලක ස්ථාපිත කර ඇති බව දන්නේද;

(ii) එම ගොඩනැගිල්ල නවීකරණය කිරීම හෝ අලුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් කිසියම් පියවරක් ගෙන තිබේද;

(iii) එසේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

397/'18

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2010 සිට 2017 දක්වා උතුරු මැද පළාතේ කාපට් අතුරා ඇති ග්‍රාමීය මාර්ග කිලෝමීටර් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මාර්ග නඩත්තු කරනු ලබන්නේ මධ්‍යම රජයෙන්ද, නොඑසේ නම්, පළාත් සභාවෙන්ද;

(iii) සමහර කාපට් අතුරන ලද මාර්ගවල කොලරය (කෙළවර) පලුදු වීම් හේතුවෙන් එම මාර්ග ඉතා ඉක්මනින් අබලන් තත්ත්වයට පත්වන බව පිළිගන්නේද;

(iv) නඩත්තු කටයුතු සඳහා අදාළ ආයතනවලට වාර්ෂිකව මුදල් වෙන් කරනු ලබන්නේද;

(v) එම මුදල්වලින් මෙම මාර්ග නඩත්තු කරන්නේද යන්න සොයා බලන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

550/'19

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිවයිනෙහි දිස්ත්‍රික්ක විසිපහ සඳහා ක්‍රිකට් සංගම් විසිපහක් තිබේද;

(ii) කිලිනොච්චි දිස්ත්‍රික්කය සඳහා වූ ක්‍රිකට් සංගමය පිහිටුවීමට මෙතෙක් අවසර ලබා නොදීමට හේතු කවරේද;

(iii) කිලිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලියාපදිංචිය සඳහා කිහිපවිටක්ම අයදුම් කර ඇතත්, මෙතෙක් එය ලියාපදිංචි නොකිරීමට හේතු කවරේද;

(iv) 2010 වර්ෂයෙන් පසුව කිලිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයට ඔබ අමාත්‍යාංශය විසින් ලබා දී ඇති ආධාර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

835/'19

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මන්නාරම දිස්ත්‍රික්කයේ මුසලි ප්‍රාදේශීය සභාවට අයත් වේප්පම්කුලම් සිට සිලාවතුර දක්වා වූ අභ්‍යන්තර මාර්ගය 2010 වර්ෂයේදී නැවත පදිංචිකිරීම් හා ආපදා සහන අමාත්‍යාංශය විසින් ඉදිකරන ලද බව එතුමා දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ සහ අවසන් කළ දිනය කවරේද;

(ii) එහි දුර ප්‍රමාණය කොපමණද;

(iii) මෙම මාර්ගය හරහා වැටී ඇති ගම්මාන කවරේද;

(iv) මෙහි කොන්ත්‍රාත් කටයුතු භාරදෙන ලද ආයතනය කවරේද;

(v) එවකට එම ආයතනයේ අයිතිකරුවන් (කොටස්කරුවන්) කවුරුන්ද;

(vi) ඒ සඳහා වෙන්කරන ලද මුදල කොපමණද;

(vii) මේ වනවිට එම මාර්ගය භාවිතා කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

859/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇහැළියගොඩ, කරඳන ප්‍රදේශයේ නායයෑමෙන් නිවාස විනාශ වූ පවුල්, ඇහැළියගොඩ කොට්ඨාසයේ අනෙකුත් වසම්වල නායයෑමට හසුව නිවාස විනාශ වූ පවුල් හා අධි අවදානම් කලාපයේ පදිංචි පවුල් ද ඇතුළුව කිසිදු පවුලක් සඳහා 2017 වර්ෂයේ දෙසැම්බර් සිට ගෙවල් කුලී දීමනාව ලැබී නොමැති බවත්;

(ii) ගෙවල් කුලී ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසූ විට ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම හිඟ ගෙවල් කුලී ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 අප්‍රේල් 05 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

11/'18

ගරු හේෂා විතානගේ මහතා,— විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) LED බල්බ මිලියන 10ක් විදුලි පාරිභෝගිකයන් අතර බෙදා දීමට කටයුතු කරන ලද්දේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය සඳහා වැයවූ මුදල කොපමණද;

(iii) එකී ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල විදුලි පාරිභෝගිකයන්ගෙන් ආපසු අයකර ගැනීමට කටයුතු කිරීම අසාධාරණ බව පිළිගන්නේද;

(iv) ඉහත ව්‍යාපෘතිය මෙහෙයවන ලද ආයතනය කවරේද;

(v) එම ව්‍යාපෘතිය අසාර්ථක වූ බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

121/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන කෘෂිකාර්මික ගොවිපොළ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගොවිපළවල නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් ගොවිපළවල සේවය කරන කම්කරුවන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iv) එම කම්කරු පිරිස අතරින් දැනට සේවයේ ස්ථිර කොට ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(v) සෙසු කම්කරුවන්ද ස්ථිර කිරීමට අමාත්‍යාංශය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

546/'19

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, අර්ධද්වීප කලාපයේ, එලුවයිතිවු නමැති දූපතෙහි පිහිටි පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දූපතෙහි පිහිටි සරවනබවා විද්‍යාලෙහි අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීමට සූදානම් ශිෂ්‍යයන් එම විද්‍යාලේ වාර විභාග සඳහා පෙනී සිටින අවසන් ශ්‍රේණිය කවරේද;

(iii) දැනට එම ශිෂ්‍යයන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා පෙනී සිටිනු ලබන විද්‍යාල කවරේද;

(iv) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය එලුවයිතිවුහි පැවැත්වීමට ඇති බාධක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

541/'19

ගරු බිමල් රත්නායක මහතා,— රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට වසර කිහිපයකට පෙර පොලිස් නිලධාරින්ට රු.150,000/-ක සහන මිලකට යතුරුපැදි ලබා දුන් බවත්;

(ii) එම යතුරුපැදි ලබා දීමේදී කිසිදු කොන්දේසියකට යටත් නොකළ බවත්;

(iii) එසේ වුවද, යතුරුපැදි ලබා ගත් විශ්‍රාමික පොලිස් නිලධාරින් සියලු දෙනාටම පාහේ රු.150,000 - 200,000 අතර මුදලක් ගෙවන ලෙස බල කර ඇති බවත්;

(iv) එම මුදල ගෙවන තෙක් විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ නොකරන බව ඔවුන්ගේ සේවා ස්ථානවලින් දන්වා ඇති බවත්;

(v) මේ අනුව විශ්‍රාමික පොලිස් නිලධාරින් විශාල පිරිසක් දීර්ඝ කාලයක සිට විශ්‍රාම වැටුප් නොලැබීම හේතුවෙන් අසරණවී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පිරිසට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස නොපමාව සුදුසු ක්‍රමවේදයක් සකසන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

690/'19

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2016 වර්ෂයේදී කොස්ගම, සාලාව යුද හමුදා අවි ගබඩාව පිපිරී යෑමෙන්,

(i) මියගිය සංඛ්‍යාව කොපමණද;

(ii) ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

(iii) විපතට පත් පුද්ගලයන්ට රජය විසින් ගෙවන ලද මුළු වන්දි මුදල කොපමණද;

(iv) මියගිය පුද්ගලයෙකු වෙනුවෙන් රජය විසින් ගෙවන ලද වන්දි මුදල කොපමණද;

(v) හානියට පත් නිවාස වෙනුවෙන් ගෙවන ලද උපරිම සහ අවම වන්දි මුදල කොපමණද;

(vi) අවතැන් වූ සියලුම දෙනාට ස්ථිර නිවාස ලබා දී තිබේද;

(vii) අවතැන් වූ පවුලකට ස්ථිර නිවාසයක් ලබා දුන් ආසන්නතම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

758/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන රාජගිරිය, අංක 288හි පිහිටි ඩී. පී. ජේ ටවර් ගොඩනැගිල්ල කුලියට / බද්දට ලබා ගත් ගිවිසුමේ පිටපතක් ලබා දෙන්නේද;

(ii) එම ගිවිසුමට අනුව එහි මාසික කුලිය, කුලී / බදු කාල සීමාව ආරම්භ වූ දිනය සහ එම කාලය අවසන් වන දිනය කවරේද;

(iii) ගොඩනැගිල්ල කුලියට / බද්දට ගෙන පරිහරණය නොකර සිටින ලද කාලය කොපමණද;

(iv) එම කාලය සඳහා ගෙවීම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එකී ගොඩනැගිල්ල ලබා ගැනීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබේ නම්, ඒ සඳහා ඉදිරිපත්ව තිබූ මිල ගණන් කවරේද;

(ii) ගොඩනැගිල්ල කුලියට ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතියක් ලැබී තිබේ නම්, එහි පිටපතක් ලබා දෙන්නේද;

(iii) අමාත්‍යාංශය කලින් පවත්වාගෙන යන ලද "ගොවිජන මන්දිරය" නැවත ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තුවෙන් කරන ලද ඉල්ලීමට ලැබුණු ප්‍රතිචාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

826 / 19

ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකළපුව දිස්ත්‍රික්කයේ පුන්නක්කුඩා ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩමක් අනවසරයෙන් අත් කර ගැනීමට එරෙහිව කොමිෂන් සභාව විසින් ගෙන ඇති පියවර කවරේ ද;

(ii) ඉඩම් (සන්තකය පැවරීම හා සීමාකිරීම්) පනත යටතේ කොමිෂන් සභාවට මඩකළපුව දිස්ත්‍රික්කය තුළ හිමිවිය යුතු ඉඩම් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ගන්නා ලද පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දිස්ත්‍රික් ලේකම්වරයා විසින් කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත යොමු කරන ලද අංක ADMGC(MN) 3/7 හා 2016.05.16 දිනැති ලිපිය මඟින් කර ඇති විමසීම් අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා ඉඩම් සම්බන්ධව සිදුකර ඇති නීතිවිරෝධී ක්‍රියාමාර්ගවලට එරෙහිව ගනු ලැබූ පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් අංක mada/75,76,77 දරන හා 2016.09.26 දින පත් කරන ලද කමිටුවේ වාර්තාව සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර කවරේද;

(ii) අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් පරිදි පිහිටුවන ලද අංක CH/LRC/01 දරන හා 2017.08.10 දිනැති පරීක්ෂණ කමිටුවේ වාර්තාව සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ගනු ලැබූ පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ඉහත (ඇ)හි සඳහන් වාර්තා මෙම සභාවට ඉදිරිපත් කිරීමට එතුමා පියවර ගන්නෙහිද ?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

829/19

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එවකට නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන හා උතුරු සංවර්ධන අමාත්‍යාංශය විසින් වවුනියාව දිස්ත්‍රික්කයේ, සෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා නිවාස 330ක් වෙන් කර තිබූ බවත්;

(ii) ඒ අනුව, වවුනියාව නේරියකුලම ග්‍රාම නිලධාරි වසමට අයත් නේරියකුලම, ඉලුප්පෙකුලම, වේප්පන්කුලම, අලගපුරි සහ අඩම්පන්කුලම යනාදී ගම්මාන 5ට අයත් ප්‍රතිලාභීන් 40දෙනකු තෝරාගන්නා ලද බවත්;

(iii) වත්මන් තත්ත්වය අනුව සෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා ආරම්භයේදී වෙන්කර තිබූ නිවාස 330 වෙනුවට නිවාස 150ක් පමණක් වෙන්කර ඇති බැවින්, ඉහත නේරියකුලම ග්‍රාම නිලධාරි වසමට අදාළව තෝරාගන්නා ලද ප්‍රතිලාභීන් 40දෙනාට නිවාස අහිමි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ආරම්භයේදී වෙන්කර තිබූ පරිදි සෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට නිවාස 330ක් ලබාදීම සම්බන්ධයෙන් පවතින බාධාවන් කවරේද;

(ii) නේරියකුලම ග්‍රාම නිලධාරි වසමේ මුලදී තෝරාගත් 40 දෙනාගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා ගත හැකි පියවර කවරේද;

(iii) ඔවුන්ට නිවාස වෙන් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?